ඉරිදා ලංකාදීප
# වයඹ
2022 මාර්තු මස 13 වැනිදා ඉරිදා

# රටේ ආර්ථික අර්බුදයෙන්
# සමෘද්ධියටත් තට්ටු

- සහනාධාරය 25% කින් කපන්න නියෝග
- සමෘද්ධි බැංකු 1074 ක් දුවන්නේ පාඩු පිට
- ආණ්ඩුව ඇතුළෙන්ම සමෘද්ධිය සමතලා කිරීමේ වෑයමක්

## සමෘද්ධි සංවර්ධන නිලධාරීන්ගේ සංගමයේ සභාපති අනුර හෙළිකරයි

(කුරුණෑගල අජන්ත රත්නායක)

**රජය මුහුණදෙමින් සිටින ආර්ථික අර්බුදය හේතුවෙන් සමෘද්ධි සහනාධාර දීමනාව ද සියයට විසිපහකින් කප්පාදු කිරීමට සැලසුම්කර ඇතැයි සමස්ත ලංකා එක්සත් සමෘද්ධි සංවර්ධන නිලධාරී සංගමයේ සභාපති අනුර බණ්ඩාර ආරියරත්න චෝදනා කරයි.**

හෙතෙම මේ බව පැවසුවේ ඒ සංගමය මගින් පසුගියදා කුරුණෑගල දී කැඳවා තිබූ ප්‍රවෘත්ති සාකච්ඡාවකදීය. එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ ආරියරත්න මහතා මෙසේද පැවසීය.

"පසුගිය දවස්වල ඉතාම සංදර්ශනාත්මක විදිහට සමෘද්ධි දීමනාව වැඩිකරලා රජය ඊට ලොකු ප්‍රසිද්ධියක් දුන්නා. නමුත් දැන් තවත් චක්‍රලේඛයක් හරහා, ලබන අප්‍රේල් මාසයේ සිට සියයට විසිපහක ප්‍රමාණයකින් සමෘද්ධි සහනාධාර දීමනාව කප්පාදුකිරීමේ වැඩපිළිවෙළක් රජය විසින් දියත්කරලා තියෙනවා. සමෘද්ධි අධ්‍යක්ෂ ජෙනරාල්වරයා පසුගිය පෙබරවාරි මාසයේදී විශේෂ චක්‍රලේඛයක් නිකුත් කරමින් රුපියල් දහසක සහනාධාර දීමනා පත්‍රිකාව වැඩිකරලා ඒවා ප්‍රතිලාභීන්ගේ ගෙවල්වලටම ගිහින් දෙන්න කියලා නියෝග කළා.

ආණ්ඩුවේ කුණු වහගන්න සමෘද්ධිය පාවිච්චි කරන්න එපා කියලා එදත් අපි ඊට විරෝධය පළ කළා. එවැනි චක්‍රලේඛයක් එක දෙරකින් එනකොට මුදල් අමාත්‍යවරයාගේ උපදෙස් මත තවත් දෙරකින් වෙනත් චක්‍රලේඛයක් එනවා. ඒ චක්‍රලේඛය හරහා සමෘද්ධි ව්‍යාපාරයට මේ වසරේ දී වෙන්කරන ප්‍රතිපාදන ප්‍රමාණය මාර්තු මාසයෙන් පසුව දැවැන්ත කප්පාදුවකට ලක්වීමට නියමිතයි.

මූලික අදියරේ දී සීයට හයකින් පටන්ගෙන අවසානයේ දී සියයට විසිපහක් දක්වා දැවැන්ත සහනාධාර කප්පාදුවක් ආණ්ඩුව විසින් සැලසුම් කරලා තියෙනවා. අවාසනාවකට වගේ සමෘද්ධිය කප්පාදු කිරීමේ වගකීමත් සමෘද්ධි සංවර්ධන නිලධාරීන්ට පටවලා තියෙනවා. මේ කුණු හැම එකක්ම අපිට භාරගන්න බැහැ. ආණ්ඩුවේ අඩුපාඩු ආණ්ඩුව විසින්ම නිවැරදි කරගත යුතුයි. ඒකට සමෘද්ධිය පාවිච්චි කරන්න එපා. එවැනි සහනාධාර කප්පාදුවක් කරනවා නම් අදාළ වසමේ දේශපාලනඥයා ඇතුළු සමස්ත ග්‍රාමීය කමිටු විසින්ම එහි වගකීම භාරගත යුතු වෙනවා. එවැනි තත්ත්වයක් ඇති වෙනවා නම් පමණයි සමෘද්ධි සංවර්ධන නිලධාරීන් ලෙස අපි ඒ කටයුත්තට දායකවෙන්නේ.

එහෙම නැතුව සමෘද්ධි අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් දැනට නිකුත්කරලා තියෙන චක්‍රලේඛයට අනුව තවත් එක් නිලධාරියෙක් සමග එකතුවෙලා සමෘද්ධි දීමනා කප්පාදුකිරීමේ රාජකාරිය නම් අපි කිසිසේත්ම ඉටු කරන්නේ නැහැ. ආණ්ඩුව බේරගන්න හෝ බැබලෙන්න කරන වැඩවලට ගමේ දේශපාලඥයින් ඇතුළු සියලුම ග්‍රාමීය කමිටු නිලධාරීන් සහභාගී කරගන්නවා. නමුත් සහනාධාර කපලා,



මිනිස්සුන්ගෙන් බැනුම් අහන වැඩවලට සමෘද්ධි දෙපාර්තමේන්තුව පමණක් තනිකරලා යොදවලා තියෙනවා."

'දේශපාලන ඇඟිලි ගැසීම් සහ තවත් හේතු කිහිපයක් නිසා යම් නුසුදුසු පිරිසක් සමෘද්ධි සහනාධාර ලබන බව ඇත්ත. නමුත් මේ කප්පාදුවෙන් ආණ්ඩුව අපේක්ෂා කරන්නේ නිවැරදි ලෙස සමෘද්ධි සහනාධාර ලබාදීමක් නෙවෙයි. රට වැටිලා තියෙන දැවැන්ත ආර්ථික අගාධයත් එක්ක සමෘද්ධි ව්‍යාපාරය පිට පටවලා සහනාධාර කප්පාදුකිරීමේ පටු අවශ්‍යතාව ඉටුකරගන්නයි මේ සැලසුම් කරලා තියෙන්නේ. මේ කුමන්ත්‍රණයට අපි අහුවෙන්නේ නෑ. මුළු රටම ආර්ථික ආගාධයකට ගමන් කරමින් තිබෙන අවස්ථාවක ජනතාව ආණ්ඩුවෙන් ඈත්වීම වළක්වාගැනීම සඳහා තමයි සමෘද්ධි ව්‍යාපාරය මත මෙවැනි අසාධාරණ වගකීමක් පටවලා තියෙන්නේ.''

''සෞභාග්‍යයේ දැක්මෙන් සමෘද්ධි ව්‍යාපාරය සුරක්ෂිත කරන්න පොරොන්දු වෙලා තිබුණත් ඒ සියල්ල දැන් කැලේට විසිකරලා තිබෙනවා. අපේ ප්‍රශ්න විසඳන්න මැදිහත්වෙන්න කියලා දැනට අවුරුද්දකට වැඩි කාලයක් තිස්සේ ජනාධිපතිතුමා, අගමැතිතුමා සහ මුදල් ඇමැතිතුමා ඇතුළු බලධාරීන්ගෙන් අපි ඉල්ලනවා. නමුත් ඊට කිසිම ඇහුම්කන්දීමක් නෑ. සමෘද්ධි ව්‍යාපාරය සමතලා කිරීමේ දැවැන්ත වෑයමක් මේ වනවිට ආණ්ඩුව තුළින්ම ක්‍රියාත්මක වෙමින් තියෙනවා. එහි ප්‍රතිඵලයක් විදිහට රට පුරාම තියෙන සමෘද්ධි බැංකු 1074 ක් මේ වනවිට පාඩු ලබමින් තිබෙනවා" දැයි හෙතෙම පැවසීය.

මෙම මාධ්‍ය හමුවට සමස්ත ලංකා එක්සත් සමෘද්ධි සංවර්ධන නිලධාරී සංගමයේ භාණ්ඩාගාරික කෝසල විජේපාල සහ උපලේකම් මනෝජ් ධම්මික රාජපක්ෂ යන මහත්වරුද සහභාගි වූහ.

# වඩුවාකෙටුගලේ ගල්කොරිය යළි ඇරඹීමට පිඹුරුපත් සැකසෙනවා

## දඹදෙණි රාජමහා විහාරාධිකාරී හිමියෝ කියති

(කුරුණෑගල අජන්ත රත්නායක)

**දැනට තහනමට ලක්කර ඇති, ඓතිහාසික දඹදෙණි රාජධානියට අයත් වඩුවාකෙටුගල ආශ්‍රිතව පවත්වාගෙන යමින් තිබූ ගල්කොරිය නැවත ආරම්භ කිරීම සඳහා පිඹුරුපත් සැකසෙමින් ඇති බව දඹදෙණි රාජමහා විහාරාධිකාරී නාරංගොඩ සංඝානන්ද හිමියෝ පවසති.**

ඒ පිළිබඳ වැඩිදුරටත් අදහස් දැක්වූ උන්වහන්සේ මෙසේ ද පැවසූහ.

''දඹදෙණි රාජධානියට අයත් වඩුවාකෙටුගලට සම්බන්ධ ප්‍රදේශය යොදගනිමින් ගල් කොරියක් ආරම්භ කිරීම සම්බන්ධයෙන් පහුගිය දිනවල විශාල විරෝධතාවයක් නැඟුණා. මේ විරෝධතාවයත් එක්ක අදළ ගල්කොරිය සඳහා නිකුත් කරලා තිබුණු පුරාවිද්‍යා සහ පාරිසරික බලපත්‍ර තාවකාලිකව අහෝසි කරලා විමර්ශනයක් කරන්නට යෙදුනා.

නමුත් මේ වෙනකොට එලෙස තහනම් කෙරුණු ගල්කොරිය නැවත වතාවක් ආරම්භ කිරීමට පිඹුරුපත් සකස්වෙනවා කියන කාරණාව අපිට ආරංචි වෙලා තියෙනවා. දඹදෙණි රාජධානියේ ස්මාරකයක් විදිහට සැලකෙන වඩුවාකෙටුගල ගල්කොරියක් සඳහා යොදගැනීම ගැන මහා සංඝරත්නයේත්, ප්‍රදේශවාසීන්ගේත් විශාල විරෝධයක් තියෙනවා. මෙවැනි ඓතිහාසික ස්ථානයක ගල්කොරියක් පවත්වාගෙන යාම සඳහා අවසර ලබාදීම පිළිබඳව අපේ තියෙන්නෙ බලවත් සංවේගයක්.

මෙම ගල්කොරිය නැවත ආරම්භ වුණොත් දඹදෙණි රාජමහා විහාරයට අයත් දයකකාරකාදීන් ඇතුළු විවිධ පිරිස් තුළ විශාල කැලඹීමක් ඇති වේවි. දඹදෙණි රාජධානිය තුළ සුළු වශයෙන් ඉතුරුවෙලා තියෙන මේ ස්මාරක ටික හෝ අපි රැක ගත යුතුයි. මේ සම්පත ආරක්ෂා කරගැනීමට හැම රාජ්‍ය නිලධාරියෙක් සහ බලධාරියෙක්ම බැඳී සිටින වග අපි සිහිපත් කරන්නවා"යි උන්වහන්සේ පැවසූහ.

# ගොවියාට ප්‍රමුඛතාව දෙන්න රජයේ වැඩවලට ඉන්ධන දීම නවතා දැම්මා

## පොල්පිතිගම සමුපකාර සංගමයේ සභාපති ගාමිණී අතපත්තු කියයි

(මොරගොල්ලාගම සිසිර කැලේගම)

**පෝලිම්වල වාහන තබාගෙන රියදුරන් විඳින දුක දෙස බලා රජයේ කොන්ත්‍රාත් වැඩවලට හා කොම්පෝස්ට් ව්‍යාපෘතිවලට තම ඉන්ධනහලෙන් ඉන්ධන නිකුත් කිරීම තාවකාලිකව නවතා දමා ඇතැයි පොල්පිතිගම විවිධ සේවා සමුපකාර සංගමයේ සභාපති ගාමිණී අතපත්තු මහතා පවසයි.**

පොල්පිතිගම සමුපකාර ඉන්ධන පිරවුම්හල අසල දිගු පෝලිම්වල නවතා තිබෙන වාහනවලට ඉන්ධන ලබා දෙන්නේ කෙසේ දැයි අප කළ විමසීමක දී සභාපතිවරයා එසේ සඳහන් කළේය.

ඒ අවස්ථාවේ දී තවදුරටත් අදහස් දැක්වූ සභාපති අතපත්තු මහතා මෙසේ ද සඳහන් කළේය.

"ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ (සිපෙට්කෝ) බවුසර්වලට ඉන්ධන නිකුත් කරන්නේ නිසි ක්‍රමවේදයකට අනුවයි. එක බවුසරයකට සාමාන්‍යයෙන් ලීටර් 13,200 ක පමණ තෙල් පිරවිය හැකියි. හැබැයි ඒ බවුසරය තනිකරම ඩීසල් හෝ පෙට්රල් ම වෙන්නේ නැහැ. ඩීසල් ලීටර් 6600 ක් හා පෙට්රල් ලීටර් 6,600 ක් ලෙසට එය බවුසරයකට කොටස් කරනවා.

එලෙස ගෙනෙන ඉන්ධනවලින් රෝහලේ ගිලන් රථ සේවා, පොලීසිය, ප්‍රාදේශීය සභාව, ලේකම් කාර්යාලය ඇතුළු රජයේ අත්‍යවශ්‍ය සේවා සඳහා ලීටර් 1000 ක් ඉතිරිකර ගත යුතුයි. රජයේ අනුමැතිය යටතේ පවත්වාගෙන යන ඉන්ධනහල් වෙත චක්‍ර ලේඛයක් මගින් එසේ කරන්න කියා දැනුවත් කර තිබෙනවා. ඒ අනුව ඉතිරි ප්‍රමාණය ජනතා අවශ්‍යතා සඳහා නිකුත් කරනවා.

ඒ අතරින්ද රජයේ කොන්ත්‍රාත් සමාගම්වල සංවර්ධන වැඩ සඳහා අපි සමඟ ගිවිසුම් ගහලා ඉන්ධන ඉල්ලලා මුදල් තැන්පත් කරපු අයත් ඉන්නවා. තවත් ව්‍යාපෘති සඳහාත් ඉන්ධන දෙන්න කියලා ප්‍රදේශයේ බලධාරින් අපිට උපදෙස් දීලාත් තිබෙනවා.

නමුත් මේ වෙලාවේ ගොවියා පැත්ත වැටිලා. අස්වැන්න වැස්සට පෙර නෙළා ගන්න බැරිව ඔවුන් අසරණ වෙලා තමයි ඉන්නේ. ඒ දෙස සානුකම්පිතව බලා අත්තිකාරම් ලෙසට අප ආයතනයේ මුදල් තැන්පත් කළ අයටත්, රජයේ උපදෙස් මත පවත්වාගෙන යන කොම්පෝස්ට් ඇතුළු ව්‍යාපෘතිවලටත් ඉන්ධන දීම තාවකාලිකව නවතා, ඒවාත් ගොවියාගේ අස්වැන්න ගැනීමට උපකාරිවන යන්ත්‍ර සූත්‍රවලටත්, අන් වාහන වෙතත් හැකි ලෙසට සීමාකර හෝ බෙදා දෙනවා. මේ ඉන්ධන හිඟය දිගටම පවතින්නේ නැහැ. රජය මැදිහත් වී එය වහාම විසඳයි. එවිට පෝලිම් තත්ත්වයද නැතිවෙතැයි සභාපති අතපත්තු මහතා වැඩිදුරටත් පැවසීය.

# මොනරුන් ශීඝ්‍රයෙන් බෝවීමෙන වගා හානි දිනෙන් දින ඉහළට

(ගල්ගමුව - ඇන්.ජේ. පතිරාජ)

**වයඹ පළාතේ වියළි කලාපයට අයත් ප්‍රදේශවල මොනරුන්ගේ බෝවීම ශීඝ්‍රයෙන් ඉහළ යන බවත්, ඒ නිසාම ඒ සතුන්ගෙන් වගාවන්ට සිදුවන අලාභහානි දවසින් දවස වැඩිවන බවත් ගොවීහු කියති.**

වී වගාවට මෙන්ම එළවළු, පලතුරු හා ධාන්‍ය වගාවන්ට ද මොනරුන් කරන්නේ බරපතළ හානි බවද වී වැපුරූ දින සිට අස්වැන්න නෙලන තෙක් වී වගාවට හානි කරන බවත් ගොවියෝ පවසති.

වපුරා දින තුන හතරක් ගතවන තෙක් වප්පතේ බීජ කන බවත් ඉන් පසුව පැළ ගොයම හා බණ්ඩි ගොයම තලන බවත් පීදුනු පසු හා කිරට නැමුණු පසු වී කරල් ගිල දමන බවත් ගොවීහු කියති.

මුං, කව්පි, මෑ ආදියෙන් කරල් හටගත් විගස ඒවාද ගිල දමන බව පවසන ගොවීහු එළවළු පැළ දලු කාලයේදීම තළා පොඩි කරන දමන බවද කියති.

මීට දශක තුන හතරකට පෙර මොනරුන් දැක ගැනීමට වැව් පිටියකට හෝ වනාන්තරයක් අසලට යාමට සිදු වුවත් මේ වනවිට වියළි කලාපයේ සෑම ගමකම මෙන්ම මොනරුන් රංචු පිටින් දැක ගත හැකි බව ජනතාව කියති.

මොනරුන් වැඩි වීමට බලපා ඇති හේතු මොනවාදැයි වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තු උසස් නිලධාරියෙකුගෙන් විමසූ විට ඔහු ප්‍රකාශ කළේ මොනරුන්ගේ විලෝපිකයින් වඳවීම හා හිඟ වීම ඊට බලපා ඇති ප්‍රධාන සාධකය බවය.

හිවලුන්, සර්පයින් වාගේ සත්තු තමයි මොනරුන්ගේ විලෝපිකයින් වන්නේ. මේ සත්තු දැන් බොහොම හිඟයි. ඒ නිසා බාධාවකින් තොරව මොනරුන්ට තමන්ගේ ගහණය වැඩිකර ගන්න හැකියාව ලැබී තිබෙනවා. ඒ වගේම මොනරුන්ගේ විලෝපිකයකු ලෙස මිනිසාත් කාලයක් පත්ව සිටියා. මිනිස්සු දැන් දෙවියන්ට බයයි. ඒ නිසා විශේෂයෙන්ම මොනරුන්ට මර උගුල් අටවන්නේ නෑ.


ඇත්තටම වල් අලින්ගෙන් වගා බිම්වලට සිදුවන හානියට වඩා වැඩි හානියක් මොනරුන්ගෙන් සිදුවෙනවා. වල් අලියා වගා බිමේ සුළු

### අලින්ගෙන් වන හානිවලට වඩා මොනරුන්ගෙන් වන හානි විශාලයි

#### වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව කියයි

ප්‍රමාණයක් සම්පූර්ණයෙන්ම විනාශ කරනවා. ඒක අපට ලොකුවට පේනවා. සනත් ලොකුයිනේ. ඒත් මොනරුන් වගා බිමේ හැම තැනම විනාශ කරනවා. ඒක ලොකු විනාශයක්. ඒත් හැමතැනම කරන නිසා ලොකුවට පේන්නේ නෑ යි ඒ නිලධාරී මහතා වැඩිදුරටත් කීය.

## සමන්ගේ සමයං



- ආණ්ඩුවේ ආර්ථික අර්බුදය නිසා සමෘද්ධි සහනාධාරයෙන් 25% ක් කපන්න යනවලු බං !
- නැතුව ඉතින් දේශපාලකයන්ගෙයි නිලධාරීන්ගෙයි දීමනා අඩු කරන්න පුළුවන්යැ?

කිවුල ආසනික් කැඩ්මියම් ඇතුළු බැර ලෝහ ඉවත් කරන
RO ජල පෙරණ
කර්මාන්ත හා ව්‍යාපාර සඳහා (දිනකට 1000L සිට 20000L දක්වා)
- පැයකට 250L (දිනකට 5000L)
- සියලුම විදුලි උපාංග සඳහා වසරක වගකීම
- 40x40 මෙම්රින් සඳහා වසරක වගකීම
- ජලය පරීක්ෂා කරන TDS මීටරය නොමිලේ
- ජලය මැනීම සඳහා මීටරය නොමිලේ
- ගෙවීමේ ක්‍රම

කොන්දේසි සහිතයි
C.K Water system, Rideegama, Kurunagala.
Tel: 071 169 167 9

උසස් පෙළ අවසන් ඔබට
ද්වි මාසික ඉංග්‍රීසි කථා පුහුණුව
තාරුණ්‍යයේ ඉංග්‍රීසි පාසල දැන් නිකවැරටියේදී
මෙවර විශේෂ වට්ටමක්
~~19900/-~~ 14900/-
නොමිලේ ගුරු පුහුණුව සඳහා සිසුන් ලියාපදිංචි කෙරේ.
ආර්ථික අපහසුතා ඇති සිසුන්ට අධ්‍යාපනය නොමිලේ
11 වන කණ්ඩායම සඳහා පාඨමාලා ආරම්භය
මාර්තු 16 පෙ.ව.8.30
SPEAKING WRITING READING LISTENING
සියල්ල ආවරණය කර ඔබට අනිවාර්යයෙන්ම ඉංග්‍රීසි කථා කිරීමේ හැකියාව සමඟ පාඨමාලාව අවසානයේ පිළිගත් සහතිකයක්...
සතියේ දින 05 ම පුරා මාස 02 ක් උදෑසන 8.00-2.00 දක්වා
ඔබගේ සාර්ථකත්වයට සුවිශේෂී ඇරඹුමක් සඳහා අප හා එක්වන්න...
KINGS COLLEGE
සිරිපැල ගොඩනැගිල්ල, දෙවන මහල, පුත්තලම් පාර - නිකවැරටිය.
Hotline 0777 442 449 Office 0377 242 444 | 0773 962582
kingscollege2019@gmail.com

# මී ඔය පාලම අසල අයියනායක පිළිරුවක්



**පාදෙණිය - අනුරාධපුර මාර්ගයේ ඇල්ල ප්‍රදේශයේ සිට මී ඔය පාලම දක්වා අයියනායක අඩවිය ලෙසින් ප්‍රසිද්ධියට පත්ව ඇත. ඒ මාර්ගයේ ගමන්ගන්නා බොහෝ දෙනා අයියනායක දෙවියන්ගේ පිහිට පතති.**

ඒ වෙනුවෙන්ම මී ඔය පාලම අසල දර්ශනීය අයියනායක පිළිරුවක් ඉදිකිරීමට අඹන්පොළ පොලිස් ස්ථානාධිපති පොලිස් පරීක්ෂක සමන් පෙරේරා මහතා කටයුතු සංවිධානය කළේය. මී ඔය ශ්‍රී ගෞතම බුද්ධ විහාරස්ථානයට යාබදව එහි විහාරාධිපති ජයබිම විමලවංශ නාහිමිගේ අනුශාසනා පරිදි ස්ථානාධිපති සමන් පෙරේරා මහතා සුබ මොහොතින් එහි ඉදිකිරීම් අරඹනු ලැබීය.

(අඹන්පොළ - අනිල් ගාමිණී විජේරත්න)

# ප්‍රජා පොලිස් ඒකකයෙන් රෝගී කතකට රෝද පුටුවක්



**නිකවැරටිය, හීලෝගම ග්‍රාම නිලධාරී වසමේ රෝගී කාන්තාවකට රෝද පුටුවක් පිරිනැමීම නිකවැරටිය පොලිසියේ ප්‍රජා පොලිස් ඒකකයේ නිලධාරීන් අතින් සිදු කෙරිණි.**

හීලෝගම ප්‍රදේශයේ පදිංචි අඩු ආදායම්ලාභී මෙන්ම රෝගී තත්ත්වය මත ඇවිද ගැනීමේ අපහසුතාවයට ලක්ව සිටි පී.වී. සෝමාවතී මව වෙනුවෙන් මෙම රෝද පුටුව පිරිනැමුණ අතර වසම බාර ග්‍රාම නිලධාරී සුසන්ත වික්‍රම්සිරි මහතා ද එක්ව සිටියේය.

කොට්ඨාස බාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී උපුල් චන්දන අබේසිංහ මහතාගේ උපදෙස් අනුව සහකාර පොලිස් අධිකාරී බණ්ඩාර මහතාගේ අධීක්ෂණයෙන් ප්‍රජා පොලිස් ඒකකයේ ස්ථානාධිපති පො.ප. ගාමිණී මහතාගේ මෙහෙයවීමෙන් ප්‍රජා පොලිස් ඒකකයේ නිලධාරීහු වැඩසටහන සංවිධානය කළහ.

(නිකවැරටිය ප්‍රියානි මංගලිකා)

# හෙළසරණ සංවිධානයෙන් දහම් පාසලට මේස පුටු




**මහනාන්නේරිය, ගල්කරුපැලැස්ස රාජමහා විහාරස්ථානයේ පවත්වාගෙන යන දහම් පාසලට බලවත් අඩුපාඩුවක්ව පැවති මේස, පුටු හිඟය සම්පූර්ණ කර දීමට කටයුතු කළ බව නාන්නේරිය පොලිසියේ ප්‍රජා පොලිස් ඒකකය කියයි.**

ප්‍රජා පොලිස් ඒකකයේ මැදිහත් වීම මත හෙළ සරණ සංවිධානයේ මූල්‍ය අනුග්‍රහයෙන් මේ පරිත්‍යාගය සිදු කොට තිබේ.

මේස පුටු පරිත්‍යාග කරන අවස්ථාවට නාන්නේරිය පොලිස් ස්ථානාධිපති පොලිස් පරීක්ෂක ආර්.අයි.බී. ජයරත්න, ප්‍රජා පොලිස් ඒකකයේ කොස්තාපල් රාජකරුණා (73337) යන මහත්වරු ඇතුළු පිරිසක්ද දහම් පාසලේ ගුරුවරු, ශිෂ්‍ය ශිෂ්‍යාවෝද සහභාගී වූහ.

(සේයා), සටහන - ගල්ගමුව ඇන්.ජේ. පතිරාජ)






අගුල් දමා ඇති වැසිකිළි පද්ධතිය



පදික මංතීරුව

# වැසිකිළි නැති මුන්නේශ්වරමේ ලක්ෂ 176 කින් ඇවිදින මංතීරු

**අත්‍යාවශ්‍ය පාරිභෝගික භාණ්ඩ මිල ජනතාවට දරාගත නොහැකි ලෙස දිනෙන් දින ඉහළ යයි. ශ්‍රී ලංකාවාසී සියලු ජන කොටස්වල එදිනෙද කටයුතු මේ වන විට නොසිතූ ලෙසින් කඩා වැටී රටට කවද යහපත් වේදැයි නිශ්චිතව පැවසීමට කිසිවකුට හැකියාවක් ඇත්තේ නැත.**

ආණ්ඩුව මේ වන විට පුන පුනා කියනුයේ රට තුළ උග්‍ර මූල්‍ය හිඟයක් ඇතිවී තිබීම නිසා ආර්ථිකය කඩා වැටී ඇති බවයි. එසේ නම් ආණ්ඩුව කළ යුතුව ඇත්තේ රටේ මූල්‍ය තත්ත්වය යහපත් අතට පත් කරන කාර්යයන් ප්‍රථමයෙන්ම ඇති කිරීමට තියෙන මුදල් අර පරිස්සමෙන් යුතුව යෙදවීමය. එහෙත් වටින් ගොඩින් අහන්න දකින්න ලැබෙන ඇතැම් ක්‍රියාකාරකම් අනුව ආණ්ඩුව ඒ මතය තේරුම් නොගෙන අනවශ්‍යය සංවර්ධන කටයුතු සඳහා මුදල් වැය කරන බව පෙනීයයි.

මේ දිනවල හලාවත මුන්නේශ්වරම පුද බිම තුළ ද ප්‍රමුඛ නොවන සංවර්ධන කාර්යයක් සඳහා ආණ්ඩුව කෝටි ගණනක මුදලක් වැය කරන බව පෙනී යයි.

1988 ආනමඩුවේ දී පැවැති ගම්උදා ප්‍රදර්ශනයට සමගාමීව මුන්නේශ්වරම පුද බිම පූජා බිමක් වශයෙන් නම් කර එහි එන බැතිමතුන් සඳහා අවශ්‍ය මූලික පහසුකම් ලබා දීමට පියවර ගනු ලැබීය. මේ වන විට ඒ පහසුකම් අකා මකා දමා වෙනත් සංවර්ධන සැලැස්මක් ක්‍රියාත්මක වන බව පෙනේ.

එද පූජා වට්ටි අලෙවිකරුවන් සඳහා කඩ පේළියක් ඉදි කළ අතර මේ වන විට ඒ කඩ කිසි භාවිතයකින් තොරව නිසා කඩා ඉවත් කර ඇත.

ඒ වෙනුවට මුන්නේශ්වරම මහා දේවාල බාරකාර මණ්ඩලය මඟින් මල් අලෙවි කරන්නන් සඳහා කඩ පේළියක් ඉදිකර මල් අලෙවි කරන්නන්ට බදු දී ඇති බව කියයි.

හලාවත මුන්නේශ්වරම පුද බිම වැඳ පුදා ගැනීම පිණිස දිවයිනේ සතර දිග් භාගයේ සිට පැමිණෙන බැතිමතුන්ගේ පහසුව සඳහා බව කියමින් මේ දිනවල කෙරෙන සංවර්ධන කාර්යයෙන් අනවශ්‍ය මුදල් නාස්තියක් බවත් මේ වෙනුවට පුද බිම වටා ඇති වාරි පද්ධතිය සංවර්ධනය කිරීම ඵලදායක බවත් ප්‍රදේශවාසී ගොවියෝ පෙන්වා දෙති.

පුද බිම කරා එන බැතිමතුන්ගේ පහසුව පිණිස හලාවත කුරුණෑගල මාර්ගයේ මුන්නේශ්වරම වැව අයිනෙන් පදික මංතීරුවක් මෙන්ම දේවාලය ඉදිරිපස ඇති කුඩා බිමක් ගොඩකර බැතිමතුන්ට විවේක ගැනීමට ස්ථානයක් සකස් කිරීමට මේ දිනවල නාගරික සංවර්ධන අධිකාරිය මඟින් පියවර ගෙන තිබේ.

කුරුණෑගල මාර්ගය ඔස්සේ පා ගමනින් එන බැතිමතුන්ට යම් යම් අපහසුතාවන්ට මුහුණ දීමට සිදුවන නිසා වැව අයිනෙන් අඩි පහක පමණ බිමක් ගොඩ කර දැනට මීටර් 200ක පමණ දිගට මෙම මංතීරුව සකස් කිරීමට මේ වන විට පෞද්ගලික අංශයේ කොන්ත්‍රාත්කරුවෙකුට භාරදී ඇති බව හෙළි වෙයි.

මෙතෙක් කල් මෙහි එන බැතිමතුන් තම වාහන මහ දේවාලයට යාබද රථගාලේ නවතා වැඳුම් පිදුම් කිරීමට යන අතර මේ නිසා කිසිදු බාධාවක් නොවූ හෙයින් මේ වන විට සකස් කෙරෙමින් පවතින පදික මංතීරුව මහජන මුදල් කාබාසිනියා කිරීමක් බවත් කියයි.

මෙම පුද බිම කරා පැමිණෙන බැතිමතුන්ට අවශ්‍ය වැසිකිළි පහසුකමක් හෝ සකස් නොකර ඇවිදින පදික මංතීරු සකස් කිරීම විහිළුවක් බව අසල මල් කඩවල හිමිකරුවන් පෙන්වා දෙති. දුර ඈත සිට එන බැතිමතුන් වැසිකිළි යාම පිණිස අසල්වැසි නිවෙස් කරා යන බවත් ඔවුහු පෙන්වා දෙති.

ප්‍රේමදාස යුගයේ ඉදි කළ වැසිකිළි පද්ධතිය මේ වන විට ජරා ජීර්ණව විනාශයට යමින් ඇති අතර දේවාල භාරකාර මණ්ඩලය මඟින් ඉදි කරන ලද නව වැසිකිළි පද්ධතිය පාවිච්චියට නොගෙන අගුළු දමා වසා දැමීම නිසා වන්දනාවේ පැමිණෙන අය වැසිකිළි අවශ්‍යතාවන් ඉටුකර ගැනීමේ දී ගැටලු රැසකට මුහුණ දෙන බවත් ඔවුහු පෙන්වා දෙති.

තමන් මුන්නේශ්වරම වැව ආශ්‍රිතව කුරුණෑගල මාර්ගය දිගට විවිධ ගස් වර්ග සිටුවා ඇති බවත් මෙම අනවශ්‍ය පදික වේදිකා ඉදිකිරීම නිසා ඒ ගස්වල පැවැත්මට ද හානි සිදුවිය හැකි බවත් පරිසර සංවිධාන කිහිපයක නියෝජිතයෝ පෙන්වා දුන්හ.

මේ සම්බන්ධයෙන් තොරතුරු ලබා ගැනීමට නාගරික සංවර්ධන අධිකාරියේ හලාවත කාර්යාලයට කතා කළ අවස්ථාවේ දී මෙම කාර්යය වයඹ පළාත් කාර්යාලයෙන් නිසා පළාත් අධ්‍යක්ෂවරයාගෙන් තොරතුරු ලබා ගන්නා ලෙස අපට දැන්වීය.

ඒ අනුව නාගරික සංවර්ධන අධිකාරියේ වයඹ පළාත් කාර්යාලයෙන් විමසූ අවස්ථාවේ දී පළාත් අධ්‍යක්ෂවරයා කාර්යාලයෙන් බැහැර ගොස් ඇති බව කී නියෝජ්‍ය අධ්‍යක්ෂ රත්නායක මහතා කියා සිටියේ මෙමම සංවර්ධන කාර්යය කරන නාගරික සංවර්ධන අධිකාරියේ උද්‍යාන අලංකරණ ව්‍යාපෘති අධ්‍යක්ෂවරියගෙන් විමසන ලෙසයි.

ඒ අනුව උද්‍යාන අලංකරණ ව්‍යාපෘති අධ්‍යක්ෂ ඉන්දිකා බාලසූරිය මහත්මිය වෙතින් විමසූ අවස්ථාවේ දී ඇය කියා සිටියේ මෙමම මුන්නේශ්වරම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් කිසිදු තොරතුරක් තමන් සතුව නැති බවත් ඒ සියලු විස්තර හලාවත කාර්යාලයෙන් ලබාගත යුතු බවත් ඒ කාර්යාලයට තමා කරුණු මාධ්‍යයට දෙන ලෙස නියෝග කරන බවත් ඒ අනුව යළි හලාවත කාර්යාලයෙන් විස්තර ලබා ගන්නා ලෙසත් බාලසූරිය මහත්මිය අපෙන් ඉල්ලා සිටියාය.



ප්‍රේමදාස යුගයේ සවි කළ පූජා නගර නාම පුවරුව



දැනට භාවිත කරන මුන්නේශ්වරම දේවාලයට යාබදව ඇති රථ ගාල

## හලාවත තැනැත්තෙක් අගමැතිගෙන් කළ ඉල්ලීමක් අනුවයි මේවා හදන්නේ

### නාගරික සංවර්ධන අධිකාරියේ නියෝජ්‍ය අධ්‍යක්ෂ මුතුගල

**ඒ අනුව හලාවත කාර්යාලයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ එම්.ඒ.ඩී. මුතුගල මහතා ඇමතූ අවස්ථාවේ දී මෙසේ කීය.**

හලාවත තැනැත්තෙක් අගමැතිවරයාගෙන් කර ඇති ඉල්ලීමක් අනුව මෙම පදික මංතීරුව ඇතුළු සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීම අප වෙත බාර වූවා. මූලික පියවරක් වශයෙන් මේ සඳහා රුපියල් 17615150ක් (එක්කෝටි හැත්තෑ හය ලක්ෂ පහළොස් දහස් එකසිය පනහක්) වැය කරනවා. මේ මගින් කුරුණෑගල පාරේ පවතින තදබදය ඉවත් වෙනවා. ඈතින් එන බැතිමතුන්ට විවේක ගෙන ආහාරපාන ගන්නත් වාහන නවතන්නත් තව කොටසක් ඇති කරනවා. මෙමම කාර්යය අනවශ්‍ය සංවර්ධන ව්‍යාපෘතියක් කියා පැවසීම අසාධාරණයි. ඒ වගේම වැව සංවර්ධනය කිරීමට අපි ඉදිරියේ පියවර ගන්නවා යයි ද කීය.



යෝජිත ගිමන් හරින ස්ථානය

සටහන සහ ඡායාරූප

හලාවත ඔගස්ටින් ප්‍රනාන්දු

# ලක්ෂ 400 කින් හැදූ සියඹලන්ගමුව රෝහල අවුරුදු 4 ක් තිස්සේ වහලා

**රුපියල් ලක්ෂ 400 ක් වැයකොට ඉදිකරනලද පොල්පිතිගම සියඹලන්ගමුව නව රෝහල වසර හතරක පමණ කාලයක සිට වසා දමා ඇති අතර එය මෙතෙක් ජනතා අයිතියට පත්කර නොතිබීම හේතුවෙන් දිනෙන් දිනම විනාශයට යමින් පවතින බව ප්‍රදේශවාසීහු පවසති.**



නව රෝහලක් ඉදිකර මෙසේ විනාශවීමට ඉඩ හැරීම ජාතික අපරාධයක් බව පෙන්වාදෙන ප්‍රදේශවාසීහු මෙමම රෝහලට කිලෝ මීටරයක් දුරින් තලාව ප්‍රදේශයේ ද මධ්‍යම බෙහෙත් ශාලාවක් තිබිය දී මෙමම රෝහල ඉදිකිරීම මුදල් නාස්ති කිරීමක් බව ද පෙන්වා දෙති. ගමේ නිසා මෙමම නව රෝහල ආයුර්වේද රෝහලක් බවට පත්කරන්නැයි ඔවුහු එක හඬින් ඉල්ලා සිටිති.

**ප්‍රදේශවාසී ජනතාවගේ ඉල්ලීම පිළිබඳවත් රෝහල වසා දමා තිබීම පිළිබඳවත් පොල්පිතිගම ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්.එච්. ධර්මසේන මහතාගෙන් පො.පෙ. කළ විමසීමක දී මෙසේ පැවසීය.**

''ජනතාව කියන්නේ සම්පූර්ණ ඇත්ත. අවුරුදු හතරක් වෙනවා මේ රෝහල් ගොඩනැගිල්ල හදලා. එම ගොඩනැගිල්ල දැන් යළිත් අලුත්වැඩියා කළ යුතු තත්ත්වයකට පත්වෙලා තියෙන්නේ. මේවා ජනතාවගේ මුදල් වැය කරලා ඉදිකළේ කැළේට අරින්න ද? රෑ මේවා ජාතික අපරාධ වගකිවයුතු අංශවලට මේ ගැන නොයෙක් විට කිව්වා. ඒත් තවම වැඩක් වුණේ නෑ.

## ජනතාව ඉල්ලන්නේ මේ ගොඩනැගිලිවල ආයුර්වේද රෝහලක් ආරම්භ කරන්න කියලයි

### පොහොට්ටු මන්ත්‍රී ධර්මසේන කියයි

තව දෙයක් කියන්න ඕනෑ. සියඹලන්ගමුවට ඒ කියන්නේ මෙතනට බටහිර වෛද්‍ය මධ්‍යස්ථානයක් අවශ්‍ය නෑ. මේ රෝහලට කිලොමීටරයක් දුරින් තලාව නගරයේ රජයේ මධ්‍යම බෙහෙත් ශාලාවක් තියෙනවා. එතනින් එහාට ගියාම නිකවැව දිස්ත්‍රික් රෝහල තියෙනවා. ඒ නිසා ජනතාව ඇතුළු මම කියන්නෙත් මේ වටිනා ගොඩනැගිලි ප්‍රයෝජනයට අරගෙන ආයුර්වේද රෝහලක් මෙතන ආරම්භ කරන්න කියලායි. මොකද මේ පළාතට ආයුර්වේද රෝහලක් නැති නිසා. මෙ පළාතේ ගොවිතැන් කරලා ජීවත්වෙන අහිංසක මිනිස්සුන්ගේ ඇගේ පතේ අමාරුවට තෙල් බෙහෙත් ටිකක්, කසාය ටිකක්, අරිෂ්ඨයක් ගන්න තැනක් නෑ. මේ කාලේ මුදල් ගෙවලා ඉංග්‍රීසි බෙහෙත් ගන්නත් අමාරුයි. මේ අවට ගම්මානවල මිනිස්සුන්ට ආයුර්වේද ප්‍රතිකාරයක් ගන්න කිලෝ මීටර් 100 ක් විතර දුර ගෙවාගෙන කුරුණෑගලට හරි අඹන්පොලට හරි නැත්නම් ගල්නෑවට හරි යන්න ඕනෑ.



පොල්පිතිගම ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්.එච්. ධර්මසේන

මේ නිසා මම වයඹ පළාත් ආයුර්වේ ද කොමසාරිස්වරයාගෙන් විශේෂ ඉල්ලීමක් කරනවා. මේ වටිනා ගොඩනැගිලි ටික ප්‍රයෝජනයට අරගෙන අහිංසක ජනතාව ගැන හිතලා මෙතන ආයුර්වේද රෝහලක් ආරම්භ කරන්න කියලා.

ඒ ධර්මසේන මන්ත්‍රීවරයාගේ ඉල්ලීමයි.

පසුගිය ආණ්ඩුවෙන් කළ එකක් හින්ද තමයි ඔය ගොඩනැගිලි ටික කැලේට ඇරලා තියෙන්නේ කියලා තමයි අපට හිතෙන්නේ. අපේ රටේ දේශපාලනේ හැටිනේ. මේ පළාතේ ගම් උද හැදුවා සජිත් මහත්තයා. අද ඒවාත් බාගෙට කලෑ වැදිලා. කවුරු හැදුවත් මේ මහජන මුදල් බව තේරුම් ගන්න ඕනෑ. ඇත්තටම අපට නැත්තේ ආයුර්වේද රෝහලක් තමයි. ඒක ලබා දෙනවා නම් හොඳයි. ඒවා නොකෙරෙන එකයි අපට කනගාටු යැයි නම හෙළිකිරීමට අකැමැති පුද්ගලයෙක් එසේ පැවසීය.

සටහන - ගොකරැල්ල - චරිත රත්නායක

ඡායාරූප - පොල්පිතිගම - ජයවර්ධන. එම්. සෙනෙවිරත්න


කැණීම් කරමින් පැවති සමයේ



පේසාවළලු සංරක්ෂණය කිරීමෙන් පසු


ගේඩි බොරදම් හා තීරු බොරදම් ගඩොල්

# අවුරුදු 1200 ක් පැරැණි මහායාන චෛත්‍යයක් මහ පොළොවෙන් මතුවෙයි


චෛත්‍යය මතුකරගත්තේ මේ පස් ගොඩැල්ලෙනි

**අතීතය අපට දායාද කළ උරුමයන් බොහෝමයක් තාමත් ඇත්තේ පොළොව යට බව සිතෙන වාර අපමණය. කැණීම් කොට වරින් වර මතු කර ගන්නා ඒ වටිනා උරුමයන් මගින් වරෙක අපේ රටේ ඉතිහාසය වෙනස් කරයි. ඉතිහාසය තවමත් ඈතට ගෙනියයි. රටේ ප්‍රෞඪත්වය, අභිමානය ඉහළට ඔසවා තබයි. බෞද්ධ පදනම මත ගොඩනැගුණු ලාංකීය සංස්කෘතියේ, ශිෂ්ටාචාරයේ වටිනාකම ඔපවත් කරයි.**


බක්මීවැවේ සීලරතන හිමි


නිශ්ශංක විජේසිංහ


ආර්.ඇම්. කරුණාරත්න

ඇහැටුවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි කඳුරුවැව, වේරගල පුරාණ රජමහා විහාර භූමියෙන් ද එවැනි අගනා, වටිනා, ඉපැරණි දාගැබක දුර්ලභ ගණයේ පේසා වළලු මතු කරගෙන තිබෙයි. මෑත ඉතිහාසයේ ලංකාවෙන් හමුවූ හොඳම පේසා වළලු මේවා බව පුරා විදුවෝ පවසති. බෞද්ධාගමික ගොඩනැගිලිවල සෞන්දර්යාත්මක බව ආරෝපණය වූයේ මහායාන බලපෑම මත බවත්, මේ පේසාවළලුවල ඒ සුන්දර බව දකින්නට ලැබෙන බවත් පුරාවිදුවෝ කියති.

ශත වර්ෂ ගණනාවක් ගස්, ගල්, පස් ගොඩැලිවලට යටවී තිබූ මේ වටිනා පෞරාණික සම්පත පිහිටා ඇති ඒ පුණ්‍ය භූමියට පියවර තැබුයේ එහි වැඩිමනත් තොරතුරු දැනගැනීමේ අටියෙනි.

**මේ එහිදී අපට හමුවූ කඳුරුවැව පදිංචි ආර්.එම්. කරුණාරත්න මහතා කී කතාවයි.**

"ඓතිහාසික ගල්කිරියාකන්දේ බටහිර පැත්තේ තමයි අපේ මේ වේරගල පුරාණ පන්සල පිහිටලා තියෙන්නේ. විශාල ගල් අතලක් ඇසුරු කරගෙන තමයි පුරාණ නටබුන් පිහිටලා තියෙන්නේ. කඳුරුවැව වැව නමින් හඳුන්වන මේ වැවේ උතුරු පැත්තේ ගල්ගිරියාකන්දේ පාමුල තවත් පුරාණ නටබුන් සහිත ස්ථානයක් තිබෙනවා. ඒ ස්ථානයේ කටාරම් කෙටූ ගල් ලෙන් විස්සක් විතර තියෙනවා. තවත් නටබුන් හා ලෙන් ලිපි දකින්න තියෙනවා.

අපි විශ්වාස කරන්නේ ඒ ස්ථානයේ වනවාසී භික්ෂූන් වැඩ සිටි වන සෙනසුනක් බවත්, මේ ස්ථානය ග්‍රාමවාසී භික්ෂූන් වැඩ සිටි ස්ථානයක් ලෙසයි. ඒ අනුව අපේ මේ වේරගල පන්නල අනුරාධපුර යුගයේ මුල් කාලයේ ඉදිවෙන්න ඇති කියලා විශ්වාස කරන්න පුළුවන්. දැනටත් මේ භූමියේ මතුපිට සිරිපතුල් ගල්, පහන් කණු, ගල් කණු, පුරාණ ගොඩනැගිලිවල අත්තිවාරම්, ගඩොල් වාගේ නටබුන් දකින්න තියෙනවා."

වේරගල පුරාණ විහාර භූමියේ තියෙන පිළිම ගෙය හා එහි පිළිම, බිතු සිතුවම් ආදිය මහනුවර යුගයට අයත් ඒවා බව තමයි පුරා විද්‍යා නිලධාරීන් කියන්නේ. මේ පිළිම ගේ සමාධි බුද්ධ ප්‍රතිමාවක්, හිටි පිළිම අටක් තියෙනවා. ඊට අමතරව විෂ්ණු දේව ප්‍රතිමාවකුත් තියෙනවා. ඒ දේව ප්‍රතිමාවත්, බුද්ධ ප්‍රතිමාත් එක පෙළට නිර්මාණය කරලා තියෙනවා. ඒකත් මේ පිළිමගේ විශේෂත්වයක්. මොකද දේව ප්‍රතිමා වෙන තැනක ස්ථානගත කර තිබීම තමයි අපි දැකලා තියෙන්නේ."

**නිශ්ශංක විජේසිංහ මහතාද කඳුරුවැව පදිංචිකරුවකු වන අතර විහාරස්ථානයේ උන්නතිය වෙනුවෙන් වෙහෙස වන්නෙකි. මේ ඒ මහතා දැක්වූ අදහස්ය.**

"අපේ පරපුරේ කවුරුත් දන්නේ නෑ ඔය කැණීම් කරපු ස්ථානයේ ඉපැරණි චෛත්‍යයක් තියෙනවා කියලා. ඔතන තිබුණේ ගල් හා පස් ගොඩනැගිල්ලක්. අපේ ගම්මුන්ගේ මතකය වෙලා තිබුණේ මේක දෙවියන්ගේ ධාතු නිධන් කළ දේව ගොඩනැගිල්ලක් කියලා. ගමේ වාර්ෂිකව කෙරෙන චාරිත්‍රවලදී මේ ගොඩනැගිල්ල ශුද්ධ පවිත්‍ර කරන එක තමයි මුලින්ම කරන්නේ. ඊළඟ දවසේ මල් පෙරහැරක් කරනවා. ගම වටේ පූජාව අරන් ගිහින් අවසානයේ මේ ගොඩනැගිල්ල වටා පැදකුණු කරලා බාරහාර ඔප්පු කරනවා. මේ ස්ථානයේ ගුප්ත බලවේග තියෙන බවට විශ්වාසයක් තියෙනවා.

"මේ දේවතා ගොඩනැගිල්ල අපි දන්න කාලේ සිට තුන් වතාවක් නිධන් හොරුන් හාරලා තියෙනවා. ඊට පෙරත් අවස්ථා ගණනාවකදී නිධන් හොරුන් මේ ස්ථාන හාරා ඇති බව පුරා විද්‍යාවෙන් කීවා. පන්සලට දාගැබක් නැති නිසා දායක සභාව තීරණය කළා ඔය ගොඩනැගිල්ල පාවිච්චියට ගෙන දාගැබක් ඉදි කරන්න. අපේ අදහස පුරා විද්‍යා දෙපාර්තමේන්තුවට දැනුම් දුන්නා. පුරාවිද්‍යාවේ නිලධාරීන් ඇවිත් අර ගොඩැල්ලේ කැණීම් කටයුතු කරද්දි තමයි පරණ චෛත්‍යයක පේසා වළලු මතු කර ගත්තේ. ඒවා දුර්ලභ ගණයේ පේසා වළලු බව තමයි ඒ නිලධාරීන් කියන්නේ. මේ කැණීම්වලදී ස්වර්ණ හුණුගල්වලින් නිර්මාණය කළ කරඬු පියනක් ලැබුණා. කළු ගල් කරඬු පියන් තුනක් සොයා ගත්තා. මේවායේ මුල් කොටස් නෑ.

"දැන් ඒ පැරණි පේසා වළලු ඒ තිබුණු ආකාරයටම සංරක්ෂණය කරල තියෙනවා. චෛත්‍යයේ ගර්භය හා සළපතළ මළුව, වැලි මළුව, පවුර ආදී අංග ඉදිකර ගන්න වෙන්නේ දායක සභාවට. චෛත්‍යය ඉදිකරන්න පමණක් රුපියල් ලක්ෂ 91 ක් වියදම් ඇස්තමේන්තු කරල තියෙනවා. ඒක බොහොම අමාරු කාර්යයක්."

**මේ පිළිම ගේ සමාධි බුද්ධ ප්‍රතිමාවක් සහ හිටි පිළිම අටක් තියෙනවා. ඊට අමතරව විෂ්ණු දේව ප්‍රතිමාවකුත් තියෙනවා**

**මෑත ඉතිහාසයේ පුරා විද්‍යා දෙපාර්තමේන්තුවෙන් සොයාගත් හොඳම පේසා වළලු තිබුණේ මේ ස්තූපයේ**

**දැන් මතුකරගෙන ඇති පේසාවන් අනුව ලංකාවේම තියෙන්නේ මෙවැනි ස්තූප දෙකක් කියලයි පුරාවිද්‍යා නිලධාරීන් කියන්නේ**

**වේරගල කැණීම් කටයුතු බාර ප්‍රධානි ලෙස කටයුතු කොට ඇත්තේ පුරා විද්‍යා නිලධාරී සුදත් වික්‍රමසිංහ මහතාය. මේ සම්බන්ධයෙන් ඒ මහතා කීවේ මෙවැන්නකි.**

"පන්සලට අලුතින් චෛත්‍යයක් හදන්න ඕන කියල ගම්මුන්ගෙන් ඉල්ලීමක් ලැබුණා. ඒ අනුව අපේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය අනුව අපි ඒ ස්ථානයට ගියා. ඒ ගොඩනැගිල්ල දෙවියන්ගේ ධාතු නිධන් කළ දේවතා ගොඩනැගිල්ලක් ලෙස ගම්මුන්ගේ විශ්වාසය තිබුණා. ඒත් පුරා විද්‍යා දෙපාර්තමේන්තුව හඳුනා ගත්තේ ඒ ස්ථානයේ ස්තූපයක් ඇති බවට නිගමනය කරල කැණීම් කටයුතු කළා.

මේ ස්ථානය හත් අට වතාවක් නිධන් සොරුන් විනාශ කරලා තියෙනවා. ඒත් වාසනාවකට මෙන් පේසා වළලු ඉතාම හොඳට ආරක්ෂා වෙලා තියෙනවා. කැණීම්වලදී මතුකරගත් පේසා වළලු ඉතාමත් ලස්සනයි. ගේඩි බොරදම් හා තීරු බොරදම් කියන ගඩොල් වර්ග දෙකම මේ පේසා වළලු ඉදිකිරීමට යොදාගෙන තියෙනවා. බෞද්ධ ගොඩනැගිලිවලට සෞන්දර්යාත්මක නිර්මාණ එකතු වන්නේ මහායාන බලපෑමත් සමග. මේ ස්තූපයටත් මහායාන බලපෑම ලැබී තිබෙනවා.

කැණීම් කටයුතුවලදී මේ ස්තූපයේ කොත් කැරැල්ලේ ගඩොල් කීපයක් හමුවූවා. ඒ ගඩොල්වල වඩු සළකුණු අකුරු අනුව ඒවා ක්‍රිස්තු වර්ෂ 8-9 ශත වර්ෂවලට අයත් බව පැහැදිලි වෙනවා. ඒ අනුව මේ ස්තූපය ඉදිකොට ඇත්තේ මීට අවුරුදු 1200 කට පමණ පෙර බවට විශ්වාස කරන්න පුළුවන්.

ඒ වාගේම තමයි මෑත ඉතිහාසයේ පුරා විද්‍යා දෙපාර්තමේන්තුව සොයාගත් හොඳම පේසා වළලු තිබුණේ මේ ස්තූපයේ. පරණ පේසාව ඒ විදියටම සංරක්ෂණය කර තියෙද්දි ඒ මත ස්තූපයක් වයඹ පළාතේ ඉදිකරන ප්‍රථම අවස්ථාව මෙයයි. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ සැලසුමකට අනුව හා ශාස්ත්‍රීය උපදෙස් මත පෞරාණිකත්වය ආරක්ෂා වන පරිදි ඉදිරි ඉදිකිරීම් කිරීම දායකයින්ට දැන් බාර දීලා තියෙනවා. මේ ආකාරයේ ඉදිකිරීමක් කුරුණෑගල දිස්ත්‍රික්කයේ මීට පෙර සිදුවෙලා නෑ.

දැනට මේ ආකාරයට පේසාව පමණක් සංරක්ෂණය කරන්න වයඹ පළාතෙන් අවසර දීලා තියෙන්නේ මේ ස්ථානයට පමණක් වීම මෙහි ඇති තවත් විශේෂතාවක්. ඒ වාගේම වයඹ පළාතෙන් හමුවූ පැරණිතම පේසාව මෙය බවත් කියන්න පුළුවන්. කුඩා චෛත්‍යයක් විශාල කොට සැදූ ස්තූපයක් ලෙසටත් මෙය හඳුන්වන්න පුළුවන්" යි සුදත් වික්‍රමසිංහ මහතා කියයි.

**කඳුරුවැව වේරාගල පුරාණ රජමහා විහාරයේ විහාරවාසී බක්මීවැවේ සීලරතන හිමියෝ මෙසේ කියති.**

"මේ ස්ථානය ඉතාමත් වටිනා ඓතිහාසික තැනක්. දැන් මතුකරගෙන ඇති පේසාවන් අනුව ලංකාවේම තියෙන්නේ මෙවැනි ස්තූප දෙකක් කියලයි පුරාවිද්‍යා නිලධාරීන් කියන්නේ. ඒ උණගලාවෙහෙර හා වේරගල ස්තූප දෙක බවයි ඔවුන් කියන්නේ. මේ වනවිට පේසාව සංරක්ෂණය කරලා තියෙනවා. චෛත්‍යයේ ඉතිරි කොටස් ඉදිකර ගන්න වෙන්නේ අපටයි.

මේ විහාරස්ථානයට දායකයින් ඉන්නේ 150 ක් විතර. ඒ පිරිසෙන් බහුතරයක් දුප්පත්. ඉතින් දායකයින්ට මේ තරම් විශාල මුදලක් දරන්න බෑ. මේ දුර්ලභ ගණයේ ස්තූපයේ ඉතිරි වැඩ ටික කර ගැනීමට වෙන්නේ දානපතීන්ගේ ආධාරයෙන්. එදිනෙදා කුඹුරු හේන් ගොවිතැන් කොට, කුලී වැඩ කරන දායකයින්ගෙන් ඒ වියදම් පියවා ගැනීම කිසිසේත් කරන්න බෑ. ඒ නිසා ඓතිහාසිකව වටිනා ඉතාම දුර්ලභ ස්තූපයක් ලෙස මතුකර ගත් මේ ස්තූපයේ ඉතිරි වැඩ නිම කරගැනීමට හැකි පමණින් ආධාර කරන ලෙස මං පුණ්‍යවන්ත ජනතාවගෙන් ඉල්ලා සිටිනවා".

සීලරතන හිමිගේ දුරකථන අංකය 0778372511 යි.

සටහන හා ඡායාරූප
ගල්ගමුව ඇන්.ජේ. පතිරාජ


දානය සඳහා සංඝ රත්නය වැඩමවන අයුරු

# කාබනික පොහොර නැතිව වී අස්වැන්න අඩු වුවත් සිරිත් අමතක නොකළ ගොවියෝ

## ජලාශය මැද දම්සභා මණ්ඩපයක්

## වැව් බැම්මේදී භික්ෂූන්ට දානයක්


අග්‍ර ශෂ්‍ය දානයට පැසුණු වී කරල් අතින් සූරන ගොවීන් පිරිසක්

**අදටත් අපේ නිවෙස්වල ආහාර ඉඳුල් කිරීමට පෙර බුද්ධ පූජාව තැබීම සිරිතකි. එයට එක් හේතුවක් වන්නේ අප මේ ජීවත්වන භූමිය පෙර රජදරුවන් කීප දෙනකු විසින්ම බුදුන්ටත්, බුදු සසුනටත් පූජා කිරීමය. ඒ නිසා රටේ ධන ධාන්‍ය ආදි වූ සම්පත් බුදුන්ට අයිති බිමෙන් ලබා ගන්නා බුද්ධභෝග ලෙස සලකා අස්වැන්නේ අග්‍ර කොටස තෙරුවන් නමින් පිදීම පැරැණි රජ දවස සිට එන චාරිත්‍රයකි. එය එසේ නැතත් අපේ බෞද්ධ ශිෂ්ටාචාරයේ සියලු කටයුතුවලට පෙර බුදුන්, දහම්, සඟුන් නැමදීම සම්ප්‍රදායයි.**

ඊට සමගාමීව පොල්පිතිගම, මඩගල්ල, හල්මිල්ලගොල්ල වෙල් යායේ පැසුණු ගොයමෙන් නෙළා ගත් අස්වැන්නේ පළමු කොටස අග්‍ර ශෂ්‍ය දානයට බුද්ධ පූජාවට තබා ගරුතර සංඝරත්නය උදෙසා දානය පිරිනැමීමේ පින්කමක් එම වැව් බැම්ම පරිශ්‍රය තුළදී සිදු කෙරිණි.

මෙහි විශේෂ දම් සභා මණ්ඩපය ජලාශය මැද අඩි 15 ක් පමණ ගැඹුරු ජලාශයේ එක් කුළුණක් වටා ඉදිකර තිබීම විශේෂත්වයකි.

ඊට අමතරව වැව් බැම්ම මත සාංඝික දානය පිරිනැමීමට සංඝ රත්නයට වැඩ සිටීමට තවත් මණ්ඩපයක් ද ඉදිකර තිබුණි.

සෑම කුඹුරු හිමියෙක්ම තම වගා බිමෙන් පෝෂිත වී කරල් අතින් සූරා ඒවා සහල් බවට සකසා බුද්ධ පූජාව සඳහා සූදානම් කළහ.

ගරුතර සංඝරත්නය හා දස සිල් මාතාවන් දෙපාර්ශවයම පාවඩ මතින් මුතු කුඩ අතරින් ශබ්ද පූජා හා සාදුකාර මධ්‍යයේ මෙම ස්ථානයට මඩගල්ල බෝධිරුක්ඛාරාමයේ සිට වැඩම කළහ.

පෙර දින රාත්‍රියේ විශේෂ ධර්ම දේශනය ද, පසුදින සාංඝික දානයමය පුණ්‍ය කර්මය ද පැවැත් වූහ. අට පිරිකර හා සෙසු පිරිකර ගොවි ගෙවිළියන් හා ඔවුන්ගේ පවුල්වල අය එක්ව පූජා කළහ.

රාත්‍රියේ බණ ඇසීමට පැමිණි අයටත්, පසුදින උදේ හා දහවල් දානමය අවස්ථාවට සහභාගි වු සියල්ලන්ටමත් රස කැවිළි හා ආහාරවලින් සංග්‍රහ කිරීමට පැරකුම් ගොවි සංවිධානයේ සාමාජිකයෝ පියවර ගත්හ.

දානයට වැඩමකළ සංඝරත්නය අතරින් මඩගල්ල බෝධිමලු විහාරාධිපති මාවනැල්ලේ විජිතරංසි නාහිමි මෙම පින්කම ඇගයීමට ලක් කොට අනුශාසනාවක් කළහ.

'කාබනික පොහොර නැතිව අන් වසරවලට වඩා මේ වෙල් යායෙත් අස්වැන්න අඩුවෙලා බව ඇත්ත. නමුත් ඔවුන් අස්වැන්න අඩුයි කියලා රට වටේ රැල්ලකට වාගේ කරන උද්ඝෝෂණ කරන්න පෙළ ගැසුණේ නැහැ. ලද අස්වැන්නෙන් සෑහීමට පත් වුණා. සෑම වසරකම පවත්වන ඒ අග්‍රශෂ්‍ය දානය මෙවර අන් වසරවලටත් වඩා විශාල කැපවීමකින් කරන්නේ ඒ නිසයි. සංඝයා වහන්සේලා ලෙසට අපි පින්කම් දැක තිබෙනවා. නමුත් පොල්පිතිගම බල ප්‍රදේශයේ මෙවැනි පින්කමක් කරන එකම වෙල් යාය ලෙසට මේක තමයි අපි දකින්නේ. මෙතැනින් එහාට ගම්වල මෙවැනි පින්කම් ගොවියෝ එක්වෙලා මෙහෙම කරනවා මම දැකලත් නැහැ. මේ සංඝරත්නය දැකලත් නැහැ. දහමට ළැබැඳි එවැනි බාල, තරුණ, වැඩිහිටි දායක පිරිසක් අප වටා සිටීම ගැන අපි සංඝරත්නය වෙනුවෙන් ආඩම්බර වෙනවායි' විජිතරංසි නාහිමියෝ පැවසූහ.

සටහන සහ ඡායාරූප
මොරගොල්ලාගම සිසිර කැලේගම











# වී වගාව ගොඩගන්න කළයුත්තේ කුමක්ද?





**2021-22 මාස් කන්නයේ වී අස්වනු නෙළීම දැන් ආරම්භ කර ඇත. රජයේ කාබනික වගා සංග්‍රාමයෙන් පසු හා හා පුරා ලැබුණු පළමු අස්වැන්න මෙයයි. නමුත් මෙම කන්නයද කාබනික වගාව පිළිබඳව පූර්ණ නිගමනයකට එළඹීමට තරම් ප්‍රමාණවත් හැකියාවක් නොමැති බව කාගේත් අදහසයි. ඒ සියයට සියයක් කාබනික ක්‍රමයට වී වගා නොකළ නිසයි. නමුත් රසායනික සහ කාබනික පොහොරවල මිශ්‍රණයක් මෙද දක්නට ලැබුණ ද සමස්ත අස්වැන්නේ ස්වභාවය සියයට 40-75ක් අතර දෝලනය වී ඇති බව ගොවීන්ගේ අදහසයි. කෙසේ වෙතත් රජයේ ස්ථාවරය වන කාබනික සංකල්පයත් සමග වී ගොවිතැන අර්බුදයකින් තොරව ඉදිරියට ගෙන යාමට නම් කළ යුත්තේ කුමක්ද යන්න පිළිබඳව තර්කානුකූල යෝජනා කරළියට ආ යුතුය. මේ ඒ පිළිබඳව ඉරිදු ලංකාදීප වයඹ ගොවි නියෝජිතයින්ගෙන් හා විද්වත් අදහස් පෙළ ගස්වා සකස් කළ ලිපියකි.**

**පුත්තලම දිස්ත්‍රික්කයේ තබ්බෝව ව්‍යාපාරයේ වම් ඉවුර ගොවි සංවිධානයේ ලේකම් කේ.ඒ. සිරිවර්ධන මහතාගේ අදහසයි මේ.**

තබ්බෝව ව්‍යාපාරය යටතේ කුඹුරු යල මහ දෙකේම අස්වද්දනවා. අපේ ව්‍යාපාරයෙන් විශාල අස්වනු ප්‍රමාණයක් වී සංචිතයට එකතු වෙනවා. නමුත් මෙවර පැහැදිළිව පෙර කන්නයට වඩා අස්වනුවල අඩුවක් තිබෙනවා. එය දළ වශයෙන් සියයට 50ක් පමණ අඩුවක්. නමුත් ඒ ප්‍රතිශතයෙන් කාබනික වගාව පිළිබඳව පූර්ණ තක්සේරුවකට එන්න බෑ. මොකද ඇතැම් ගොවියෝ ළඟ යූරියා තිබුණා. සමහරු වැඩි මිලට අරගෙන යූරියා ගැහුවා. තවත් පිරිසක් වෙළෙඳ පොළේ තිබුණු කාබනික දියර පොහොර, පෙති වර්ග යෙදුවා.

තවත් අය ආණ්ඩුවෙන් දුන් දියර පොහොර විතරක්ම ගැහුවා. සමහරු ඒවා ගැහුවේ නෑ. මේ නිසා අස්වැන්නේ අඩු වැඩි වීම ගැන අපිට හරියටම අදහසක් ගන්න බෑ. නමුත් අපි රජයට යෝජනා කරන්න කැමතියි, කාබනික වගාවකට යනවා නම් උසස් තත්ත්වයේ කාබනික පොහොරම අපිට දෙන්න කියලා. රජයෙන් දුන්න කාබනික පොහොරවලට වඩා වෙළෙඳ පොළෙන් ගත්ත පෙති වර්ගවලින් ගොයම් ගහ වැඩුණා. පඳුරු ගැහුවා. මේ නිසා අපි ඉල්ලන්නේ කඩෙන් ගත්ත දියර පොහොර සහ පෙති වගේ හොඳ දෙයක් ගොවීන්ට නිකුත් කරන්න කියලයි.

වී වගාවට කාබනික පොහොර නිර්දේශයත් සමග සමාජයේ ඇතිවුණු උණුසුම් වාද විවාද එකහෙළා පැත්තකට තල්ලු කර දැමීමට වඩා වැදගත් වන්නේ ඒ විරෝධාකල්ප හා අගයකිරීම්වලින් මතු වුණු අදහස් හා යෝජනා කිරා මැන බලා වඩා හොඳ යාන්ත්‍රණයක් සකසා ගැනීමයි . මෙහිලා මතු වුණු ප්‍රබල චෝදනාවක් වූයේ කලට වේලාවට කාබනික පොහොර ටික තමන්ට නොලැබුණු බවයි.

**ඉඟිනිමිටිය ඒකාබද්ධ ගොවි සංවිධානයේ සභාපති එස්.ඩබ්.එම්. චන්ද්‍රසේන මහතා පවසන්නේ** රජයේ ස්ථාවරය සමඟ ගොවීන් පෙළගැස්වීමට නම් ගොවීන්ගෙන් මතු වන චෝදනාවලින් රජය තම වැඩසටහන ඔපමට්ටම් කර ගත යුතු බවයි.

රජය කියන්නේ අයෙමත් රසායනික පොහොර දෙන්නෙ නැති බව නම් අපි ගොවියෝ හැටියට ඒ වැඩේට එකඟ වෙන්න වෙනවනේ. මගේ අදහස නම් කාබනික වැඩසටහන බොහොම හොඳයි. නමුත් රජයේ වැඩසටහන සහ ගොවීන් අතර [illegible] පරතරයක් තිබුණා. ඊටත් වඩා [illegible] අපේ ගිය ඇතැම් ගොවියෝ කිසිම [illegible] නැතිව පිළිගත්තා එක පසින් කාබනික පොහොර යොදන එක නැවැත්තුවා. වගාව කහ වෙනවා කිව්වා. කුඹුරුවලට [illegible] එනවා කිව්වා. [illegible] කිව්වා. නමුත් ඒ වගේ සිද්ධීන් වුණා තමයි.

[illegible] නිසා ගොවියෝ වැඩි පිරිසක් නොමග ගියා. එක හරියන්නේ නෑ. ගොයම කහ වෙනවද නැද්ද බලන්න [illegible]. ඒ නිසා අපි කියන්නේ රැල්ලට යන ක්‍රමය නවත්වලා මේ වැඩේට අවංකවම [illegible] නම් ගොවියාට හොඳක් වෙයි කියලා. අපි රජයෙන් ඉල්ලන්නේ [illegible] ගොවියාට දෙන්න කියලයි. ඒ නිසා රජයට එල්ල වන චෝදනාවලින් මිදෙන්න නම් ලබන යලවත් කලට වෙලාවට පොහොර ටික දෙන්න. [illegible]

**කුරුණෑගල දිස්ත්‍රික් ඒකාබද්ධ ගොවි සංවිධානයේ භාණ්ඩාගාරික රත්නතිලක හේරත් මහතා පවසන්නේ ද ඒ අදහසමයි.**

අපි කියන්නේ අක්කරයකට යූරියා මිටියක්වත් දෙන්ඩ කියන එකයි. නිකම් දෙන්ඩ ඕනෙත් නෑ. සහනාධාරයක් ඕනෙත් නෑ. වෙළෙඳපොළේ සහන මිලකට ගන්න පුළුවන් නම් හොඳයි. [illegible] ඒ නිසා මේවාටත් රජයේ අවධානය යොමු විය යුතුයි.

**පාලුකඩවල පුරාණගම වලගම්බා ගොවි සංවිධානයේ සභාපති කෝසල බණ්ඩාර පවසන්නේ මෙවැනි අදහසකි.**

අපි කියන්නේ අක්කරයකට යූරියා මිටියක්වත් දිය යුතුයි කියන එකයි. මොකද ගොයම ගහ හැදෙන්න නම්, පඳුරු ගහන්න නම් යූරියා, රතු කුඩු, ටී.එස්.පී. ඕනෑමයි. මෙද ගොයම ගහ උස නෑ. පඳුරු අපෝ නෑ. පෝෂණ ඌනතාවක් පැහැදිලිවම පෙනුනා. [illegible] නිසා ඔය තරම්වත් අස්වැන්නක් ගත්තා. [illegible] කාබනික සහ රසායනික පොහොර 50ට 50ට යනව නම් තමයි

අක්කර 6000ක් යල මහ වගා කරයි. ගොවීන් පවසන්නේ අක්කරයකින් වී බුසල් 100ක් 150ක් ලබා ගන්නා බවයි. නමුත් මෙවර එය සියයට 50කින් අඩු වී ඇති බව ඔවුහු පවසති.

**කෙසේ වෙතත් ලබන යලේ නම් රසායනික පොහොරවලින් සියයට පනහක්වත් අවම වශයෙන් ගොවීන්ට ලබා දිය යුතු බව මාගල්ල ඒකාබද්ධ ගොවි සංවිධානයේ සභාපති ටී.එම්. තිලකරත්න මහතා යෝජනා කරයි.**

මේ අවුරුදු අපේ සියයට සියයක් කාබනික ක්‍රමයට එකවර යන්න ගිය නිසයි. නමුත් අපිත් කැමතියි කාබනික වගාවට යන්ඩ. මූලික පොහොරවලට කාබනික යෙදුවට ගොයම ගහ නැඟිට්ටවන්ඩ නම් රජයෙන් දෙන කාබනික පොහොරවලට අමතරව අක්කරයකට යූරියා කිලෝ 40ක් 50ක් වත් දෙන්ඩ කියන එකයි අපි කියන්නේ. අනෙක රජය කාබනික පොහොර වර්ග 4ක් ලබා දෙන බව පැවසුවත් මාගල්ලේ අපිට ලැබුණේ කාබනික පොහොරවලින් දෙවර්ගයක් පමණයි. අපේ යෝජනාව රසායනික සහ කාබනික යන දෙවර්ගයම කළවමේ යන ක්‍රමයක් තමයි. එහෙම නැත්නම් ලබන යලේ තවත් අස්වනු අඩුවෙනවා. මොකද මෙද සියයට සියයක් කාබනික වගාවට ගියේ නැහැනේ.

රට සහලින් ස්වයංපෝෂිත කිරීමේ කාර්යය ගොවියා සහ ගොවියාට පහසුකම් සලසන රජයේ සහජීවනයෙන් කළ යුතු කාර්යයකි. කාලයක් තිස්සේ පැවති ක්‍රියාවලිය වෙනසකොට ගෙන [illegible] වී වගාව ඉදිරියට යා යුතු බවයි.

> **කාබනික වගාවකට යනවා නම් උසස් තත්ත්වයේ කාබනික පොහොරම ඕනෑ. රජයෙන් දුන්න කාබනික පොහොරවලට වඩා වෙළෙඳ පොළෙන් ගත්ත පෙති වර්ගවලින් ගොයම් ගහ වැඩුණා. පඳුරු ගැහුවා**

> **අපේ යෝජනාව රසායනික සහ කාබනික යන දෙවර්ගයම කළවමේ යන ක්‍රමයක් තමයි. එහෙම නැත්නම් ලබන යල් කන්නයේ අස්වනු තවත් අඩුවෙනවා**

> **අපි කියන්නේ අක්කරයකට යූරියා මිටියක්වත් දෙන්ඩ කියලයි. නිකම් දෙන්ඩ ඕනෙත් නෑ. සහනාධාරයක් ඕනෙත් නෑ. වෙළෙඳපොළේ සහන මිලකට ගන්න පුළුවන් නම් හොඳයි**

> **කාබනික හා රසායනික පොහොර 25-75% ලෙස යෙදිය යුතුයි**
> **කෘෂි විද්‍යා මහාචාර්ය අධිකාරි**

> **ගොයම් ගසේ පැළෑටි, වර්ධක, ප්‍රජනක ආදී අවස්ථාවලට වඩාත් යෝග්‍ය කාබනික පොහොර නිපදවිය යුතුයි**
> **හිටපු සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ ඇලිවලතැන්න**

යාන්ත්‍රණයකට ප්‍රවිෂ්ට වීමයි. මේ සම්බන්ධයෙන් විද්වතුන්ගේ අදහස්වලට ද අපි අවධානය යොමු කළෙමු.

**රජරට විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම පීඨයේ පීඨාධිපති මහාචාර්ය ඒ.එම්.ජේ.බී. අධිකාරී මහතාගේ අදහසයි මේ.**

රජය මේ වැඩසටහන හඳුන්වා දුන්නේ පරිසර හිතකාමී හරිත වගාවකට රට සුදානම් කිරීමේ අදහසිනුයි. මේ අදහස වැරැදි එකක් නොවෙයි. බොහොම හොඳයි. නමුත් ගැටලුවක් වුණේ රසායනික පොහොරවලට හුරු වුණු [illegible] බීජත් එක්ක මේ වෙනස එකවර සිද්ධ කරන්න ගිය එකයි. [illegible] කාබනික හා රසායනික පොහොර සියයට 25-75 ප්‍රතිශතයක් ලෙස යෙදවීමට ගොවීන්ට අවස්ථාව සලසා දීමයි.

ඒ වගේම මේ වැඩසටහන පිළිබඳව ගොවීන් තුළ පවතින සැකය, දුර්මත දුරු කළ යුතුයි. [illegible]

වැඩේ ගොඩ දාගන්න පුළුවන්.

මාස් කන්නයේ මෙවර අස්වැන්න පිළිබඳව ඉරිදු ලංකාදීප වයඹ කළ පසු විපරමින් ගොවීන්ගෙන් ලැබුණු තොරතුරු අනුව අනාවරණය වුණු කාරණා කිහිපයකි. එනම් අස්වැන්න සියයට 50ක් අඩු බවයි. ගොයම ගස් පඳුරු ගැසීම නිසි ලෙස සිදු නොවුණු බවයි. [illegible]

ඒ කෙසේ වෙතත් තවත් පිරිසක් පෙන්වා දෙන්නේ [illegible]

**හිටපු සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ වයි.ඒ ඇලිවලතැන්න මහතා පවසන්නේ** පවතින යාන්ත්‍රණය ඵලදායි ප්‍රතිඵලයක්ම ඉලක්ක කර ගෙන වෙනස් කළ යුතු බවයි.

කාබනික වගාව ලොව පිළිගත් විශිෂ්ටතම කෘෂිකාර්මික සංකල්පයක්. නමුත් අපි අවතීර්ණ වුණේ කාලාන්තරයක් තිස්සේ රසායනික පොහොරවලට හැඩගැසුණු මහ පොළොවත් එක්ක. රසායනික පොහොරවලට හුරු වුණු බීජත් එක්ක. ඒ වගේම ගොවීන් තුළ බරපතළ විරෝධතා සැක සංකා තිබුණා. දැන් ලැබිලා තියෙන්නේ අස්වැන්නෙන් අඩක් නම් යම් යම් දෝෂ යාන්ත්‍රණයේ තිබිලා තියෙනවා. දැන් කළ යුත්තේ ක්‍රමවේදය සුදුසු ලෙස වෙනස් කර ගැනීමයි.

ලබන යල කන්නයේ අස්වැන්න තවදුරටත් අඩු වුණොත් බරපතළ ප්‍රශ්නයක් මතුවෙනවා. ඒ නිසා වී වගා කරන කලාප වෙන වෙනම තෝරාගෙන ඒ ඒ කලාපවලට වඩාත් සුදුසු කාබනික වගා යාන්ත්‍රණයක් හදන්න ඕනෑ. ඉන් පසුව කාබනික වගා ක්‍රමයේ වඩාත් නිවැරැදිම ශිල්ප ක්‍රමය හා තාක්ෂණයට ගොවීන් නැඹුරු කළ යුතුයි. ඒත් එක්කම වී වගාවේ නම් කෝකටත් තෛලය කියලා එකම කාබනික යෙදවුමකින් වී වගාවෙන් අස්වැන්න ගන්න බෑ. ගොයම් ගසේ පැළෑටි, වර්ධක, ප්‍රජනක ආදී අවස්ථාවලට වඩාත් යෝග්‍ය කාබනික පොහොර වර්ග ලබා දිය යුතුයි. එය නියමිත වේලාවට ගොවීන් අතට පත් කිරීමටත් ක්‍රමවේදයක් සැකසිය යුතුයි. ඒ වගේම ගොවීන් පැත්තෙන් එල්ලවන චෝදනා අවම කරගන්න කාබනික පොහොරවලටත් සහන පැකේජයක් හඳුන්වා දීම අත්‍යවශ්‍යයි. ඉන් අදහස් කරන්නේ රජයෙන් ලබා දෙන කාබනික පොහොර අවශ්‍ය තරම් වෙළෙඳ පොළෙන් මිලදී ගැනීමටත් අවස්ථාව සලසා දීමයි.


**බතලගොඩ වී පර්යේෂණ හා සංවර්ධන ආයතනයේ ප්‍රධාන කෘෂි විද්‍යාඥ රෝහණ තිලකසිරි මහතා පවසන්නේ** ඉදිරි යල කන්නයේ සිට කාබනික පොහොර කඩිනමින් ලබා දීමට නිෂ්පාදන යාන්ත්‍රණය විධිමත් කිරීමට කටයුතු කරමින් පවතින බවයි.

ගොවීන්ගේ වැඩි ඉල්ලීමක් තිබෙන්නේ පොහොර ටික කඩිනමින් ලබා දෙන්න කියන එකයි. ඒ සඳහා දිස්ත්‍රික් 25න්ම ඝන කාබනික සහ දියර පොහොර නිෂ්පාදකයින් වෙන වෙනම තෝරා ගෙන ඉන්නවා. ඔවුන් රජයට අවශ්‍ය ප්‍රමාණය සපයා දීමට සූදනමින් සිටිනවා. ඒ නිසා යල කන්නයේ ප්‍රමාදයකින් තොරව පොහොර සපයා දීමට හැකි වනු ඇතැයි විශ්වාසය පළ කරනවා.

වී ගොවිතැන යනු ජාතික ආර්ථිකයේ හදවතයි. ජාතික ධාන්‍යාගාරය ශක්තිමත් කිරීම සාමූහික ව්‍යායාමයකි. පත අට එකට සිඳුවා තනා ගත් ඔසුවක් සේ සියලු අදහස් හා යෝජනා තුළින් වඩාත් ඵලදායි යාන්ත්‍රණයක් වී ගොවිතැනට යෙදීම කාලීන අවශ්‍යතාවයකි.




මහාචාර්ය ඒ.එම්.ජේ.බී. අධිකාරි




හිටපු සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ වයි.ඒ. ඇලිවලතැන්න



පුත්තලම දිස්ත්‍රික්කයේ තබ්බෝව ව්‍යාපාරයේ වම් ඉවුර ගොවි සංවිධානයේ ලේකම් කේ.ඒ. සිරිවර්ධන




පාලුකඩවල පුරාණගම වලගම්බා ගොවි සංවිධානයේ සභාපති කෝසල බණ්ඩාර



මාගල්ල ඒකාබද්ධ ගොවි සංවිධානයේ සභාපති ටී.එම්. තිලකරත්න



කුරුණෑගල දිස්ත්‍රික් ඒකාබද්ධ ගොවි සංවිධානයේ භාණ්ඩාගාරික රත්නතිලක හේරත්



ඉඟිනිමිටිය ඒකාබද්ධ ගොවි සංවිධානයේ සභාපති එස්.ඩබ්.එම්. චන්ද්‍රසේන

සටහන සහ ඡායාරූප
අඹන්පොළ ශෂිකලා දර්ශනී

කොළඹ 2 හුණුපිටිය හරස් පාරේ අංක 8 දරන ස්ථානයේ පිහිටි විජය නිවුස්පේපර්ස් ලිමිටඩ් විසින් 2022 මාර්තු මස 13 වැනිදා ඉරිදා එම ස්ථානයේ මුද්‍රණය කරන ලදී